THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

# SUGGESTED SOLUTIONS

03104 - කළමනාකරණය සහ ව්‍යාපාර ආර්ථික විද්‍යාව

ගිණුම්කරණ සහ ව්‍යාපාර සහතික පත්‍ර විභාගය - I

2014 සැප්තැම්බර්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය

NOT FOR SALE

හිමිකම් ඇවිරිණි.

## " ආ " කොටස


| | | | |
|---|---|---|---|
| 1. | 4 | 11. | 3 |
| 2. | 4 | 12. | 2 |
| 3. | 3 | 13. | 3 |
| 4. | 1 | 14. | 1 |
| 5. | 2 | 15. | 2 |
| 6. | 2 | 16. | 4 |
| 7. | 3 | 17. | 2 |
| 8. | 4 | 18. | 4 |
| 9. | 2 | 19. | 3 |
| 10. | 3 | 20. | 1 |

NOT FOR SALE

**<u>පිළිතුරු අංක . 01</u>**


(අ) සම්පත් වල පවතින හිඟකම හේතුවෙන් 'තාර්කක' සංකල්පය බිහිවී ඇත. පාර්භෝගිකයින් සහ නිෂ්පාදකයින් නිවැරදි තීරණ ගැනීම සඳහා පවතින හොඳම තොරතුරු යොදාගන්නා බව ආර්ථික විද්‍යාවේදී උපකල්පනය කරනු ලැබේ. ඒ අනුව පාර්භෝගිකයන් තම තෘප්තිය උපරිම කර ගැනීමට උත්සාහ දරණ අතර නිෂ්පාදකයින් උත්සාහ දරන්නේ තම ලාභය උපරිම කරගැනීමටය.

(ආ) පහත ඇඳ ඇති නිෂ්පාදන හැකියා මායිම් රූප සටහන අනුව වක්‍රයේ ඉහළ සිට පහළට ගමන් කිරීමේදී වැඩි වන ප්‍රමාණයෙන් Y ඒකක නිෂ්පාදනය කැප කිරීම මගින් අමතර X ඒකක ප්‍රමාණයක් නිෂ්පාදනය කළ හැක. මෙය වැඩිවන ආවස්ථික පිරිවැය මූලධර්මයයි. රූප සටහනේ පෙන්වන පරිදි A ලක්ෂය හෝ වක්‍රය මත එවැනි ඕනෑම ලක්ෂයක් මත නිෂ්පාදනය කළ හැකි වන්නේ, පවතින සම්පත් හෝ නිෂ්පාදන සාධක ඵලදායී ලෙස යොදාගැනීමෙනි.




(ඇ) (i)

ආර්ථික විද්‍යා පාඩම්




(ii) ආවස්ථික පිරිවැය = $\frac{\text{කැපකරන ප්‍රමාණය}}{\text{ලබාගත් ප්‍රමාණය}}$

= 6/3 = 2 කළමනාකරණ පාඩම්

NOT FOR SALE

**පිළිතුරු අංක . 02**

(අ)

(i) සම්බන්ධිත භාණ්ඩ හෝ සේවා මිල ගණන්

ඉල්ලුම් කරන භාණ්ඩය සමග මිලට ගන්නා භාණ්ඩ එනම් අනුපූරක භාණ්ඩ හෝ ඉල්ලුම් කරන භාණ්ඩය වෙනුවට මිලට ගනු ලබන ආදේශක භාණ්ඩ සම්බන්ධිත භාණ්ඩ වේ. අනුපූරක භාණ්ඩ සම්බන්ධයෙන් මිල ඉල්ලුම් නම්‍යතාවය සෘණ අගයක් ගනී. අනෙකුත් සාධක සථාවරව තිබියදී අනුපූරක භාණ්ඩ මිල වැඩිවීමේදී සළකා බලන භාණ්ඩයේ ඉල්ලුම අඩුවේ. උදාහරණ ලෙස විදුලි ගාස්තු (මිල) සහ විදුලියෙන් ක්‍රියා කරන භාණ්ඩ අදේශණ භාණ්ඩ සඳහා මිල ඉල්ලුම් නම්‍යතාවය (සබඳතාව) ධන අගයක් ගනී. ආදේශක භාණ්ඩයක මිල ඉහල යනවිට සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම වැඩිවේ. පාන් මිල, සහල් සඳහා වන ඉල්ලුම් සම්බන්ධතාවයට උදාහරණයකි.

(ii) පාරිභෝගික ආදායම

භාණ්ඩයේ ස්වභාවය මත ආදායම හා ඉල්ලුම අතර සම්බන්ධතාව තීරණය වේ. සාමාන්‍ය භාණ්ඩයක් නම් සබඳතාව ධන අගයන් ගනී. පාරිභෝගික ආදායම ඉහලයන විට පාරිභෝගිකයා සාමාන්‍ය භාණ්ඩ වැඩිපුර මිලට ගනී.

(iii) පාරිභෝගික රුචිය

පාරිභෝගික රුචිය සහ වරණය මත සමහර භාණ්ඩ සඳහා ඉල්ලුම වෙනස් වේ. වෙළඳ ප්‍රචාරණ හෝ ප්‍රදර්ශණ මගින් වන බලපෑම් මත පාරිභෝගික ඉල්ලුම වෙනස් විය හැක.

(iv) අනාගත අපේක්ෂාවන්

අනාගත අපේක්ෂා මත භාණ්ඩ මිල ගනන් වෙනස් වේ. නරක් නොවන සහ කාලයක් පවතින පාරිභෝගික භාණ්ඩ සම්බන්ධව මෙය වැදගත්වේ. එවැනි භාණ්ඩ වල මිල ඉහළ යන බව පාරිභෝගිකයන් දැන ගතහොත් එම භාණ්ඩ වැඩිපුර මිලට ගනී.

(v) කාලගුණික හා දේශගුණික තත්ත්වයන්

සමහර භාණ්ඩ සඳහා ඉල්ලුම වෙනස් වන්නේ සෘතු අනුවය. වැසි කාලයට කුඩ සඳහා ඉල්ලුම වැඩි වේ. උත්සව සමයේදී අරක්කු සඳහා ඉල්ලුම වැඩි වේ.

(vi) ජනගහණයේ ප්‍රමාණය සහ එහි සම්මිශ්‍රණය


සමහර භාණ්ඩ පාරිභෝජනය කරනු ලබන්නේ එක්තරා ජන සංයුතියකි. ළදරුවන් වැඩි පවුල් විසින් ළදරු ආහාර සඳහා කරන ඉල්ලුම.

(ආ) ආනයනික භාණ්ඩ සඳහා බදු පැනවීම මගින් එම භාණ්ඩ මිළ ඉහල යයි. බදු පැනවීමේ ප්‍රතිඵලය තීරණය වන්නේ එම ආනයනික භාණ්ඩ සඳහා මිළ ඉල්ලුම් නම්‍යතාවය මතය. බදු පැනවීමෙන් පසු ඇති වන ප්‍රතිඵලය, එම භාණ්ඩයේ ඉල්ලුම සඳහා මිලෙහි සංවේදිතාව මත තීරණය වේ.

ආනයනික භාණ්ඩයේ ඉල්ලුම සඳහා මිල සංවේදී නම් රජය බලාපොරොත්තු වන ප්‍රතිඵලය හෝ අරමුණ ඉටුකරගත හැකි වන්නේ, ඉල්ලුම් ප්‍රමාණය විශාල ලෙස අඩුවන බැවිනි. මේ අනුව විදේශ විනිමය පිටතට ගලායාම අඩුවීමෙන් ආනයනික වියදම් අඩුකරගත හැක.

(ඇ)

NOT FOR SALE




පාර්භෝගික ආදායම වැඩිවීමත සමඟ අඩු පිරිවැය සහිත තාක්ෂණය නිෂ්පාදන ක්‍රියාවලියට හඳුන්වා දීමෙන් හා සමතුලිත ප්‍රමාණය නොවෙනස්ව තිබීමෙන්, භාණ්ඩ මිළ අඩුවීමට හේතුවන බව පැවසේ.

අඩු පිරිවැය සහිත තාක්ෂණය හඳුන්වාදීමේ ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩය සඳහා සැපයුම වැඩිවේ. කෙසේ නමුත් මෙම අවස්ථාවේ සමතුලිත ප්‍රමාණය නොවනස්ව තිබෙන නිසා පාර්භෝගික ආදායමේ වැඩිවීම හේතුවෙන් භාණ්ඩය සඳහා ඉල්ලුම වැඩිවී ඇත. ඒ අනුව අදාල භාණ්ඩය බාල භාණ්ඩයක් ලෙස නිගමනය කළ හැක.

<u>පිළිතුරු අංක . 03</u>

(අ) 1. දිගුකාලීන කොන්ත්‍රාත්/ ගිවිසුම් මගින් එකවර විශාල ප්‍රමාණයෙන් මිලට ගැනීමෙන් ඇතිවන පිරිමැසුම්

2. මහා පරිමාණ ආයතනවලට තම එක් එක් අංශයන කළමනාකරණය කිරීම සඳහා විශේෂ කුසලතාවයන් ඇති කළමණාකරුවන් පත්කිරීමෙන් ඇතිවන පිරිමැසුම්.

3. මහා පරිමාණයෙන් ණය ලබාගැනිමේදී වඩා අඩු පොලියට ණය ලබාගත හැකිවීමෙන් වන පිරිමැසුම්.


4. ප්‍රචාරක වියදම් විශාල භාණ්ඩ ප්‍රමාණයක් ආවරණය කිරීමෙන් ලබන පිරිමැසුම්.

(ආ) (i) ආයතනයක යෙදවුම් හා නිමැවුම් අතර ප්‍රශස්ථ තාක්ෂණික සම්බන්ධතාව නිෂ්පාදන ශ්‍රිතයෙන් පෙන්නුම් කරයි.

(ii) - කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රීතයෙන් පෙන්වන්නේ ආයතනයක විචල්‍ය යෙදවුම් සහ නිමැවුම් අතර සම්බන්ධතාවයකි.

- දිගුකාලයේදී ආයතනයක සියළුම යෙදවුම් විචල්‍ය තත්ත්වයට පත්වන අතර එම විචල්‍ය යෙදවුම් හා නිමැවුම් අතර සබඳතාව දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතයෙන් පෙන්නුම් කරයි.

(ඇ) අවම කාර්යක්ෂමතා පරිමාණය යනු දිගුකාලීන සාමාන්‍ය මුළු පිරිවැය අවම වන නිෂ්පාදන ලක්ෂයයි. අවම කාර්යක්ෂමතා පරිමාණයට ලඟාවීමට පෙර කරනු ලබන නිෂ්පාදන ප්‍රමාණය වෙළඳපොල තරඟකාරිත්වය අනුව අවාසිසහගත වේ.




(ඈ) (i) තාක්ෂණික මට්ටම නොවෙනස්ව පැවතීම

(ii) අවම වශයෙන් එක් නිෂ්පාදන සාධකයක් ස්ථාවරව පැවතීම.

<u>පිළිතුරු අංක . 04</u>

(අ) දළ ජාතික / දේශීය නිෂ්පාදිතයේ (GDP/GNP) සමහර අයිතමයන් එහි වෘත්තාකාර ප්‍රවාහයෙන් කාන්දුවන අතර සමහර අයිතමයන් ප්‍රවාහයට එකතු වේ. සරල ආවෘත ආර්ථිකයක ඉතිරිකිරීම් කාන්දුවීමක් වන අතර ආයෝජන "විදීමකි." සමතුලිත මට්ටමේදී විදීම්, කාන්දුවීම් වලට සමාන නිසා ආයෝජන ඉතිරි කිරීම් වලට සමාන වේ. (I = S)

(ආ) (i) C = 200 + 0.8 Yd

C = පාරිභෝජන ශ්‍රිතය

Yd = වැය කළ හැකි ආදායම

(ii) C = 200 + 0.8 Yd

C = 200 + 0.8 (Y - T)

C = 200 + 0.8 (1000 - 100)

C = 200 + 720

C = 920

NOT FOR SALE

(iii) $Y = C + I + G$

$Y = 200 + 0.8Y + 50+50$

$Y = 200 + 0.8Y + 50+50$

$Y = 300 + 0.8Y$

$0.2Y = 300$

$Y = 1,500$

(iv) ජාතික ආදායමේ ඉහළයාම , $\Delta Y = K \times \Delta I$

ආයෝජන ගුණකය, $K = \dfrac{1}{1 - MPC} = 5$

$\therefore \quad \Delta Y = 5 \times 25 = 125$

<u>පිළිතුරු අංක 05.</u>

(අ) බදු , රාජ්‍ය ණය සහ රජයේ වියදම් මත රාජ්‍ය ප්‍රතිපත්තිය ෆස්කල ප්‍රතිපත්තිවලට සම්බන්ධවන අතර මුදල් සැපයුම, පොලී හා විනිමය අනුපාත සහ ගත හැකි ණය ප්‍රමාණය මත රජයේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රතිපත්තිවලට සම්බන්ධ වේ.

ෆස්කල ප්‍රතිපත්ති ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන්නේ ආණ්ඩුව සහ ආණ්ඩුවේ ආයතන වන අතර මුදල් ප්‍රතිපත්ති මූලික ලෙස ක්‍රියාත්මක කරන්නේ, බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන මගින් මහ බැංකුව විසිනි.

(ආ) (i)

- තරසාර ඉහළ ආර්ථික වර්ධන වේගය
- පූර්ණ සේවා නියුක්තිය
- සමතුලත ගෙවුම් ශේෂය
- මිළ ස්ථායීතාව

(ii) ඉල්ලුම් කළමණාකරන ප්‍රතිපත්ති යනු ආර්ථිකයේ සමාහාර ඉල්ලුම වෙනස් කිරීම මගින් ආර්ථිකය යහපත් මට්ටමකට ගෙන ඒම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති වේ.

(ඇ) මෑත කාලයේදී මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරත්වය පහත සඳහන් පියවර මගින් ලබාගෙන ඇත.

- පවතින තැන්පතු පහසුකම් පොලී අනුපාතය (SDFR) සහ පවතින ණය පහසුකම් පොලී අනුපාතය (SLFR) අඩුකිරීම.
- වානිජ බැංකු වල රුපියල් තැන්පතු වගකීම් මත ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයේ ප්‍රමාණය (SRR) අඩු කිරීම.
- වෙළඳපොල ණය පොලී අනුපාතය සහ වෙළඳපොල තැන්පතු පොලී අනුපාතය ප්‍රමාණවත් ලෙස අඩුකිරීමට දිගුකාලීන ණය පොලී අනුපාතය තවදුරටත් අඩුකිරීමට අවකාශ ඇත.

NOT FOR SALE

*විකල්ප පිළිතුර* 5(ඇ)

ආර්ථිකයේ සමාහාර ඉල්ලුම වැඩිවීමේ අවසාන බලාපොරොත්තුව මත ආයෝජන සහ පරිභෝජන වියදම් ඉහල යැවීමට පොලී අනුපාතය අඩුකිරීම, මෑතකදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරයකට පිවිසුනි. පොලී අනුපාතය පහළ දැමීමෙන් කියැවෙන්නේ ණය සඳහා වියදම අඩුවීමෙන් පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට ණයට ගැනීම් මගින් පාරිභෝජන සහ ආයෝජන ඉහල දැමිය හැකි බවය. ඉහල ආර්ථික වර්ධන වේගයක් තුලින් දළ දේශීය නිෂ්පාදනය (GDP) වැඩි කිරීමට මහ බැංකුවේ මෑත කාලීන ගත් මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය මගින් බලාපොරොත්තුවේ. සමාහාර ඉල්ලුම වැඩිවීමත් සමඟ ආර්ථික වර්ධනයකට හේතුවේ.

<u>පිළිතුරු අංක . 06</u>

(අ)

- සාර්ථක නායකයා විශ්වාස කළහැකි පුද්ගලයකු විය යුතුය.
- අනුගාමිකයන්ගේ වැඩ පිළිබඳ හා ඔවන්ගේ භූමිකාව පිළිබඳ සාර්ථක නායකයා සැලකිල්ලක් සහ උනන්දුවක් දක්වයි. අන් අය අරමුණු කරා ලඟා වීමට පෙළඹවිය හැකි විය යුතුය.
- අවිනිශ්චිත තත්ත්වයන් වලදී ක්‍රමානුකූලව සහ අරමුණු පෙරදැරි කරමින් නායකයාට කටයුතු කළ හැකි විය යුතුය.
- ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම අරඹයා විශ්ලේෂණාත්මකව සිතීමේ හැකියාව තිබිය යුතුය.
- අනර්ගත්ව කාර්යසාධනයට යහපත් නායකයා කැපවීමෙන් කටයුතු කළ යුතුය.

(ආ) <u>X න්‍යායයේ උපකල්පනයන්.</u>

- මිනිසුන් වැඩ කිරීමට අකමැති අතර ඒවා මඟ හැරීමට උත්සාහ ගනී.
- ආයතනයේ අරමුණු වෙනුවෙන් වැඩ ගැනීමට සඳහා බොහෝ පුද්ගලයන්ට බලකිරීම, යොමුකිරීම, පාලනය කිරීම සහ දඬුවම් දෙනබවට අවවාද කිරීම කළ යුතු බව.
- බොහෝ පුද්ගලයන් යොමුකරමට අවශ්‍ය වන අතර වගකීම් භාරගැනීම ඇති අකමැත්ත, උසස්වීමට එතරම් ආශා නොකරන අතර සියළු කාරණා වලදී ආරක්ෂාව අපේක්ෂා කිරීම දැකිය හැක.

<u>Y න්‍යායයේ උපකල්පනයන්.</u>

- බොහෝ පුද්ගලයන් ආවේනිකව වැඩ කිරීමට අකමැත්තක් නොදක්වයි. බොහෝ විට මානසික සහ ශාරීරික උත්සාහයන් ස්වභාවික ලෙස සලකන අතර ඒවා ක්‍රීඩාව හෝ විවේක ලෙස සලකයි.
- මිනිසුන් තමන්ට පවරා ඇති අරමුණු ඉටුකිරීම සඳහා ස්වයං පාලනයකින් සහ ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වේ. බාහිර පාලන උපක්‍රම සහ දඬුවම් මගින් තර්ජනය කිරීම්, අරමුණු කෙරෙහි සේවකයන් යොමු කිරීමට යොදන එකම උපක්‍රමය නොවේ.
- අරමුණු වෙනුවෙන් කැපවීම ප්‍රදානයන් ලැබීමේ ක්‍රියාවලියේ කොටසක් වන අතර ප්‍රදානයක් ලැබීම සම්මානනීය හෝ ආත්ම පර්පූර්ණ අවශ්‍යතාව තෘප්තිමත් කරන්නක් වේ.



NOT FOR SALE

- පවතින තත්ත්වය සතුටුදායක වන විට, සාමාන්‍ය පුද්ගලයා දෙන ලද වගකීම් ඉටුකිරීම පමණක් නොව තවත් වගකීම් සෙවීමට පෙළඹේ.

- බොහෝ පුද්ගලයන්ට ආයතනයේ ගැටළු විසඳීම සම්බන්ධයෙන් නම්‍යතා උත්පාදන සහ නිර්මානශීලි හැකියාව ඇතැයි සැලකීම.

- බෝහෝ පුද්ගලයන්ගේ බුද්ධිමත්භාවයෙන් කොටසක පමණක් ආයතනයේ ප්‍රයෝජනයට ගැනීම.

(ඇ) <u>සමානකම්</u>

- අනුගාමිකයන්ට / යටත් සේවකයන්ට නායකයින් මෙන්ම කළමණාකරුවන් මග පෙන්වීම කරනු ලබයි.

- නායකයන් මෙන්ම කළමණාකරුවන් තම අනුගාමිකයින් යටත් සේවකයන් අභිප්‍රේරණය කළ හැකි විය යුතුය.

<u>වෙනස්කම්</u>

- සංවිධානයේ කාර්යයන් සඳහා මග පෙන්වීමක් ලෙස නායකයා සංවිධානයේ දැක්ම (Vision) නිර්මාණය කරයි. කළමණාකරුගේ ප්‍රධාන භූමිකාව වන්නේ මෙම දැක්ම සහ මෙහෙවර අදාල කාර්යයන් සඳහා ක්‍රියාත්මක කිරීමයි. නායකයා විසින් ගොඩනගන ලද උපක්‍රම අවසන් ප්‍රතිඵලය දක්වා රැගෙන යාමයි.

- කළමණාකරුවන් විසින් තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී විධාන ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමුකරති. එහෙත් නායකයන් වෙනස්වීම් සඳහා අවශ්‍ය අවස්ථාවන් කෙරෙහි විපරමින් පසුවේ. සාර්ථක නායකයින් තම ආයතනය ප්‍රගතිය වෙත පර්වර්තනය කරන අතර කළමණාකරවන් ආයතනය පවතින ආකාරයෙන් පවත්වාගෙන යාමට උත්සාහ ගනී.

NOT FOR SALE

පිළිතුරු අංක. 07

(අ)

- යටත් සේවකයන්ට පැවරිය යුතු කාර්යයන් සහ රාජකාරි ඒවා පවරන පුද්ගලයා විසින් හඳුනා ගත යුතුය.
- පවරන ලද කාර්යයන් සම්බන්ධයෙන් යටත් සේවකයන්ගෙන් බලාපොරොත්තු වන ප්‍රතිඵල හඳුනාගත යුතුය.
- අධිකාරිය පැවරීම සඳහා සුදුසු පුද්ගලයන් හඳුනාගත් පසු පැවරීම කළ යුතුය.
- වගකීම් සහ වගවීම් පැහැදිලි ලෙස නිර්වචනය කළ යුතුය. ඉහළ නිළධාරීන්ගේ යොමුකිරීම් /උපදෙස් මත තම උපරිම හැකියාවෙන් සේවකයා විසින් රාජකාරි වල යෙදීම වගකීම් ඉටුකිරීමකි. වගවීම යනු කාර්ය සාධන ප්‍රමිතීන් අනුව රාජකාරියෙහි යෙදීමය.

(ආ)

- අධිකාරිය පැවරීමට කළමණාකරුවන්ගේ ඇති අකමැත්ත.
- අධිකාරිය පැවරීමෙන්, යටත් සේවකයන්ගේ අභියෝග වලට මුහුණදීමට සිදුවිය හැකි නිසා කළමණාකරුවන් අධිකාරිය පැවරීමට බිය වේ.
- යටත් සේවකයන් කෙරෙහි විශ්වාසනීය බව නැති වීම හෝ කළමණාකරුවන්ට ඒ සම්බන්ධව තම ආත්ම විශ්වාසය නැති වීම.
- යටත් සේවකයන් සඳහා අවශ්‍ය දැනුම / හැකියාව නොමැතිවීම.
- ප්‍රමාණවත් දිරිගැන්වීම් නොමැති වීමෙන් යටත් සේවකයන් පවරණ අධිකාරිය භාරගැනීමට උනන්දුවක් නොදැක්වීම.

(ඇ)

| **රේඛීය** | **මාණ්ඩලික** |
|---|---|
| • භාණ්ඩ හා සේවා නිපදවීමේ කටයුතු වල ඍජුවම නිරතවීම. | රේඛීය සේවකයන්ගේ කටයුතු ඉටුකිරීම සඳහා වක්‍රාකාරයෙන් දායකවීම. |
| • සාම්ප්‍රදායික රේඛිය කාර්යයන් වන්නේ නිමැවුම සහ අලෙවියයි. | සාම්ප්‍රදායික කාර්යයන් වන්නේ මිලට ගැනීම ගිණුම් තැබීම, නෛතික හා පිරිස් පාලන කටයුතුය. |
| • සංවිධානයේ ප්‍රාථමික කාර්යයන් ලෙස රේඛීය ශ්‍රිතය හඳුනාගැනේ. | සංවිධානයේ ද්වීතිය කාර්යයන් ලෙස හඳුනා ගැනේ. |
| • කය වෙහෙසා කාර්යයන් ඉටුකිරීම සිදුවේ | මනස වෙහෙසා කාර්යයන් ඉටුකිරීම සිදුවේ. |

NOT FOR SALE

# නිවේදනය

මෙහි ලබාදුන් පිළිතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය "එසේම" යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු "ආදර්ශ පිළිතුරු" ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දක්වේ.

පිළිතුරු වලින් ප්‍රධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිදු ප්‍රතිඥාභාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිදු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍ර ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

[2] 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.
සියළුම හිමිකම් ඇවිරිණි.

**මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.**

NOT FOR SALE